UNESCO

IFLA



# මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනය

NATIONAL LIBRARY NLSL OF SRI LANKA

# මහජන පුස්තකාල
# පිළිබඳ
# යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනය

---

**අන්තර් ජාතික පුස්තකාල සංගම් හා ආයතන සම්මේලනයේ සහාය ඇතිව මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කරන ලදී**

NATIONAL LIBRARY OF SRI LANKA NLSL

JF 1108252
08 DEC 2022
NATIONAL LIBRARY
DOCUMENTATION CENTRE

මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශය
© ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ප්‍රථම මුද්‍රණය - 1998

ISBN 955-9011-86-3

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ ප්‍රතිපත්ති = Unesco
Public Library Manifesto.-- කොළඹ : ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලය, 1998
පි. 12 ; සෙ.මී. 21
ISBN 955-9011-86-3 මිල :

i. 027.4 - ඩිවි 21
1. මහජන පුස්තකාල 2. පුස්තකාල විද්‍යාව

UNESCO PUBLIC LIBRARY MANIFESTO

ප්‍රකාශනයේ පරිවර්තනයකි.

සැළසුම : සෝමසිරි හේරත්
මුද්‍රණය : තරංජි මුද්‍රණාලය, මහරගම
ප්‍රකාශනය : ප්‍රකාශන අංශය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත, කොළඹ - 07.

# දැනුම් දොරටුවක්

සමාජයේ සහ පුද්ගලයින්ගේ නිදහස සෞභාග්‍යය සහ සංවර්ධනය මූලික මිනිස් අගයන් වේ. මේවා සාක්ෂාත් කර ගත හැක්කේ තම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ක්‍රියාවට නැගීමට හා සමාජයේ ක්‍රියාකාරී කාර්ය භාරයක් ඉටුකිරීමට හැකියාවක් ඇති, හොඳින් දැන උගත් පුරවැසියන් මගින් පමණි. ප්‍රජාතන්ත්‍රවාදයේ උන්නතිය සහ ඵලදායි සහභාගිත්වය රඳාපවතින්නේ යහපත් අධ්‍යාපනය මෙන්ම දැනුම, චින්තනය, සංස්කෘතිය හා තොරතුරු ග්‍රහණය කර ගැනීමට ඇති නිදහස සහ ඊට ඇති අසීමිත ඉඩ ප්‍රස්ථාවන් මතවේ.

දැනුම කරායාමේ ප්‍රාදේශීය දොරටුව වන මහජන පුස්තකාලය මගින් පුද්ගලයාට සහ සමාජ කණ්ඩායම්වලට ජීවිත කාලය පුරාම ඉගෙනීම හැකියාව, ස්වාධීන තීරණ ගැනීමේ අවස්ථා හා සංස්කෘතික ප්‍රගමනය සඳහා අවශ්‍ය මූලික පහසුකම් සලසාදේ.

අධ්‍යාපනය, සංස්කෘතිය හා තොරතුරු සේවාවල ජවමාන බලවේගයක් ලෙසටද, පුද්ගලයන්ගේ සිත්සතන් වල සාමය හා

1108252

අධ්‍යාත්මික සුභ සාධනය පෝෂණය කිරීමේ අත්‍යවශ්‍ය ප්‍රතිකාරකයක් ලෙසටද මහජන පුස්තකාලය කෙරෙහි යුනෙස්කෝ සංවිධානය තබා ඇති විශ්වාසය මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් ඉදිරිපත් කෙරෙයි.

ඒ අනුව මහජන පුස්තකාල සංවර්ධන කාර්යයෙහිලා උපකාර කිරීම හා ක්‍රියාත්මක ලෙස නිරත වීම සඳහා මධ්‍යම ආණ්ඩුව සහ පළාත් පාලන ආයතන යුනෙස්කෝ සංවිධානය මගින් දිරි ගන්වනු ලබයි.

# මහජන පුස්තකාලය

<u>මහජන පුස්තකාලය යනු සියලුම ආකාරයේ දැනුම පාඨකයින්හට පහසුවෙන් ලබා ගැනීමට ඉඩ සළසන ප්‍රාදේශීය තොරතුරු මධ්‍යස්ථානයයි.</u>

මහජන පුස්තකාලයේ සේවා සමානාත්මක පදනම මත වයස, ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, ජාතිය, භාෂාව හෝ සමාජ තත්ත්වයන් නොසලකා සියලු දෙනාටම සැපයේ. මොනයම් හේතු නිසා මහජන පුස්තකාලයන්හි සාමාන්‍ය සේවාවන් සහ පුස්තකාල ද්‍රව්‍යයන්ගේ ප්‍රයෝජන ලබා ගත නොහැකි පිරිස්වලට, නිදසුන් වශයෙන් භාෂාමය සුළු ජාතීන්, ආබාධිත පුද්ගලයින්, රෝහල් ගත රෝගීන් හා සිරකරුවන් ආදීන්ට විශේෂිත සේවා හා පුස්තකාල ද්‍රව්‍ය සැපයිය යුතුය.

සියලුම වයස් සමූහවලට ඔවුනට ගැලපෙන පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි විය යුතුය. සියලුම වර්ග වලට අයත්, සුදුසු මාධ්‍ය හා නවීන තාක්ෂණ මෙන්ම සම්ප්‍රදායික පුස්තකාල ද්‍රව්‍ය වලින් ද එහි එකතු හා සේවාවන් සමන්විත විය යුතුවේ. පුස්තකාල ද්‍රව්‍යවල උසස් ගුණාත්මක බව සහ ප්‍රාදේශීය අවශ්‍යතාවන්ට හා තත්ත්වයන්ට ඒවා ගැලපෙන බව මූලිකවම

NATIONAL LIBRARY NLSL OF SRI LANKA

වැදගත්වන කරුණ වේ. වර්තමාන ප්‍රවනතා සහ සමාජ පරිනාමය මෙන්ම මානව ප්‍රයත්න සහ සංකල්පනය පිළිබඳ ස්මරණයන් ද පුස්තකාල ද්‍රව්‍යවලින් පිළිබිඹු විය යුතුවේ.

එකතු හා සේවා කිසිම ආකාරයක දෘෂ්ටිවාදාත්මක, දේශපාලනික හෝ ආගමික තහංචිවලට හෝ වානිජමය පීඩනයන්ට යටත් නොවිය යුතුය.

NATIONAL LIBRARY N L S L OF SRI LANKA

# මහජන පුස්තකාලයක මෙහෙය

තොරතුරු, සාක්ෂරතාව, අධ්‍යාපනය හා සංස්කෘතිය සම්බන්ධ පහත සඳහන් කාර්යභාරය මහජන පුස්තකාල සේවාවන්ගේ හරය විය යුතුය.

1. ළමුන් තුළ කුඩා අවධියේ සිට කියවීමේ රුචිය ඇති කිරීම සහ වර්ධනය කිරීම.
2. සෑම මට්ටමකම පුද්ගල සහ ස්වයං අධ්‍යාපනය මෙන්ම විධිමත් අධ්‍යාපනය සඳහා ආධාර කිරීම.
3. පෞද්ගලික නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය සඳහා අවස්ථා සලසා දීම.
4. ළමුන්ගේ හා තරුණවියේ පසුවන්නවුන්ගේ සංකල්පනය සහ නිර්මාණශීලිත්වය උත්තේජනය කිරීම.
5. සංස්කෘතික උරුමය, සකල කලාවන් අගය කිරීම, විද්‍යාත්මක ජයග්‍රහණ සහ නව සොයා ගැනීම් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.
6. සියලුම රංගන කලාවන්හි සංස්කෘතික හරයන් ග්‍රහණය කර ගැනීමට අවකාශ සලසා දීම.
7. අන්තර් සංස්කෘතික සංවාද පෝෂණය කිරීම සහ සංස්කෘතික විවිධත්වය සඳහා අනුබල දීම.

1106

NATIONAL LIBRARY N L S L OF SRI LANKA

8. වාචික සම්ප්‍රදාය සඳහා ආධාර කිරීම.

9. පුරවැසියන්ට සියලුම ආකාරයේ ප්‍රජා තොරතුරු ලබා ගැනීමට අවකාශ සැලසීම.

10. ප්‍රාදේශීය ව්‍යවසායයන්ට, සංගම්වලට සහ උද්‍යෝගශීලී කණ්ඩායම්වලට ප්‍රමාණවත් තොරතුරු සේවාවන් සැපයීම.

11. තොරතුරු සංවර්ධනය හා පරිගණක මෙහෙයුම් කුසලතා සඳහා පහසුකම් සැලසීම.

12. සියලුම වයස් සමූහ සඳහා වන සාක්ෂරතා කටයුතු සහ වැඩ සටහන්වලට සහාය දීම, සහභාගිවීම සහ අවශ්‍ය නම් එබඳු කටයුතු ආරම්භ කිරීම.

NATIONAL LIBRARY N L S L OF SRI LANKA

# අරමුදල්, ව්‍යවස්ථා සහ ජාල පද්ධති

මහජන පුස්තකාල සේවාවන් ප්‍රතිපත්තියක් වශයෙන් නොමිලේ සැපයිය යුතුවේ.

මහජන පුස්තකාල පවත්වාගෙන යාම පළාත් සහ ජාතික අධිකාරීන්හි වගකීම වේ. සුවිශේෂ ව්‍යවස්ථාවන් මගින් ඊට රුකුල් දියයුතු අතර ජාතික සහ පළාත්පාලන අධිකාරීන් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සැපයිය යුතුවේ. සංස්කෘතිය, තොරතුරු සැපයීම, සාක්ෂරතාව සහ අධ්‍යාපනය හා සම්බන්ධ ඕනෑම දිගුකාලීන උපාය මාර්ගයක් තුළ මහජන පුස්තකාල සේවය අත්‍යවශ්‍ය අංගයක් විය යුතුය.

ජාතික මට්ටමේ පුස්තකාල සම්බන්ධීකරණයක් සහ සහයෝගිතාවයක් සහතික කිරීම සඳහා ව්‍යවස්ථා සහ උපාය මාර්ගික සැලසුම් සකස් කළ යුතු අතර පිළිගත් සේවා ප්‍රමිතීන් පදනම් කරගත් ජාතික පුස්තකාල ජාලයක් වර්ධනය කළ යුතුවේ.

ජාතික පුස්තකාල, ප්‍රාදේශීය පුස්තකාල, පර්යේෂණ පුස්තකාල, විශේෂ පුස්තකාල, පාසැල්, විද්‍යායතන සහ විශ්ව විද්‍යාල

පුස්තකාල වලට අනුරූපවන ලෙස මහජන පුස්තකාල ජාලය සැලසුම් කළ යුතුය.

NATIONAL LIBRARY NLSL OF SRI LANKA

9

# මෙහෙයුම සහ කළමනාකරණය

පළාතේ ප්‍රජා අවශ්‍යතාවයන්ට අනුකූලව, අරමුණු, ප්‍රමුඛතා සහ සේවාවන් නියත ලෙස දක්වමින් පැහැදිලි ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය. මහජන පුස්තකාලය ඵලදායී ලෙස සංවිධානය කළ යුතු අතර, මෙහෙයුම් කටයුතුවලදී වෘත්තියමය ප්‍රමිතීන් පවත්වාගෙන යායුතු වේ.

අදාළ විවිධ කොටස් සමග සහයෝගිතාවය - නිදසුනක් ලෙස ප්‍රාදේශිය, කලාපීය සහ ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ ද පාඨක සමූහ සහ වෙනත් වෘත්තිකයන් සමග සහයෝගය සහතික කර ගත යුතුය.

ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට අදාළ සේවාවන් ලබා ගැනීමට හැකි විය යුතුය. මේ සඳහා මැනවින් පිහිටුවන ලද පුස්තකාල ගොඩනැගිලි, යහපත් කියවීම් සහ අධ්‍යාපන පහසුකම් මෙන්ම අදාළ තාක්ෂණික පහසුකම් සහ පාඨකයින්ට පහසු, ප්‍රමාණවත් විවෘත කර තැබීමේ වේලාවන් වැනි පහසුකම් ද තිබිය යුතුය. පුස්තකාලයට පැමිණිය නොහැකි පාඨකයින් සඳහා පැවැත්වෙන බාහිර සේවාවන් ද ඒ හා සමානව වැදගත්වේ.

ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ප්‍රජාවන්ගේ විවිධ අවශ්‍යතාවලට අනුව පුස්තකාල සේවාවන් සකස් විය යුතුය.

NATIONAL LIBRARY N L S L OF SRI LANKA

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA



පුස්තකාලයාධිපතිවරයා පාඨකයින් සහ සම්පත් අතර සිටින සක්‍රිය අතරමැදියෙකි. ප්‍රමාණවත් සේවයක් සැපයීම සඳහා පුස්තකාලයාධිපතිවරයාගේ වෘත්තීය හා අඛණ්ඩ අධ්‍යාපනය ඉතා වැදගත් වේ.

සියලුම සම්පත් වලින් පාඨකයින්ට ප්‍රයෝජන ලබාගැනීම සඳහා බාහිර සේවාවන් සහ පාඨක අධ්‍යාපන වැඩ සටහන් සැපයිය යුතුය.

23

027.4

Public Library Policy

National Library of Sri Lanka
1108252

NATIONAL LIBRARY
NLSL OF SRI LANKA